සෞඛ්‍ය අමාත්‍යාංශය

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

පුරප්පාඩු

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල වනාහි, පාර්ලිමේන්තුව මගින් ස්ථාපිත අස්ථිත්වයක් වන අතර, එය භාරකාර මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලබයි. මෙම අරමුදල වෙනත් දේ අතර, භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සෞඛ්‍ය අංශයේ හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය සහය සපයා දීමට කටයුතු කරනු ලබයි.

ජාතික සෞඛ්‍ය සංවර්ධන අංශයේ හිස්ව පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් නිපුණතාපූර්ණ, ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර වන අතර, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය හා හිමිකම ලබනු ඇත.

1. ලේඛකාධිකාරී / ගණකාධිකාරී තනතුර - (තනතුරු 01) යි

රැකියා විස්තරය :

අරමුදලේ, භාරකාර මණ්ඩලයේ මග පෙන්වීම හා යොමුකිරීම හා විධානය යටතේ, කාර්ය සාධන කටයුතු මෙහෙයවීම සහ භාරකාර මණ්ඩලයේ රැස්වීම් හා හමුවීම්වල කටයුතු පිළියෙල කිරීම, සුදානම් කිරීම, එම රැස්වීම්වල ගන්නා තීරණ සටහන් කර වාර්තාගත කිරීම හා පසු විපරම් කටයුතු හා ක්‍රියාකාරකම් තහවුරු කර ගැනීම අන්තර්ගත වන අරමුදලේ ලේකම් වශයෙන් සහ ප්‍රඥ සම්පන්න කළමනාකරණය හා මූල්‍ය ආයෝජනයන් සිදු කිරීම යන්න තනතුරේ රාජකාරිවලට, අන්තර්ගතය.

අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කළමනාකරණය, ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව යන ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු ලත් තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් එක් වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීයවේදී වරලත් ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වී සිටීම හා අවම වශයෙන් එක් වසරක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් යෝග්‍යතා (සුදුසුකම් ලැබීමෙන් පසුලත්) පළපුරුද්ද.

අභ්‍යන්තර අපේක්ෂකයින් :

ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් හට අදාළ වන සියලු සුදුසුකම් ලබා සිටිය යුතුය.

වයස : අවුරුදු 22 ට නොඅඩු සහ 45 කට නොවැඩි විය යුතු වන අතර, මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

වැටුප් පරිමාණය (තනතුරට අදාළ වන පරිදි)

MM 1-1-2016 (රු. 53,175-10X1,375-15X1,910-95,575) 2016.01.01 වන දින සිට බලපවත්වන පරිදි වනු ඇත.

මූලික වැටුප : රු. 53,175/- සහ ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/- අංක 02/2016 දරන කළමනාකරණ චක්‍රලේඛය අනුව හා පරිදි ගෙවනු ලැබේ.

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මගින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලිඛිත පරීක්ෂණයකට යටත්ව, කෙටි ලැයිස්තුගත කරනු ලබන අපේක්ෂකයින් අතරින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ විෂය ක්ෂේත්‍රය :

(අ) භාෂා නිපුණතාවය / ප්‍රවීණත්වය

(ආ) අභියෝග්‍යතා පරීක්ෂණය

(ඇ) භාෂා ප්‍රවීණතාව (නිපුණතාව) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ ප්‍රකාශනයේ / භාෂණයේ කුසලතාව සහ හැකියාව සහ අවබෝධ කර ගැනීම සහ අක්ෂර විත්‍යාසය සහ සරල ව්‍යාකරණ නීති රීති පිළිබඳ යෙදවීමේ දැනුම පරීක්ෂා කිරීම සඳහා අදාළ හා අන්තර්ගත වනු ඇත.

(ඈ) අභියෝග්‍යතා පරීක්ෂණය

මෙම ප්‍රශ්න පත්‍රය ඔහුගේ/ ඇයගේ නීල රාජකාරී කටයුතුවල කාර්ය සාධනය පිළිබඳ දක්ෂතාව සහ අභියෝග්‍යතාව පරීක්ෂා කර මෑත බැලීම සඳහා සැලසුම් කර සකස් කර ඇත.

02. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 01 යි

රැකියා විස්තරය :

බලයලත් නිලධාරීන්ගේ අධීක්ෂණය හා මාර්ගෝපදේශකත්වය යටතේ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ කාර්යයන් හා ක්‍රියාකාරකම් ඉටුකිරීම සහ සංවිධානයේ කළමනාකාර ශ්‍රේණියේ හි රාජකාරී ඉටු කිරීමෙහිලා පහසුකම් සැලසීම/ සහය වීම/ අතිරේක සැපයීම.

තනතුරට අදාළ වැටුප් පරිමාණය

MA 1-1-2016 රු. (27,910-10X300-7X350-4X495-20X660-48,500)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපනික

අ) i) සිංහල/ දෙමළ

ii) ඉංග්‍රීසි භාෂාව

iii) ගණිතය

විෂයයන් ඇතුලුව සම්මාන සාමාර්ථ හතරක් සහිතව එක් වරකදී අ.පො.ස. (සා/ පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්වීම.

ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගය (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනකින් සමත්වීම.

වයස : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය

තනතුරට අදාළ අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයවලුන් අතරින් වඩාත් සුදුසු අය ලෙස තෝරාගනු ලැබූ කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්ගෙන් ලිඛිත තරගකාරී විභාගයක් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ලිඛිත තරගකාරී විභාගය සඳහා විෂයයන්,

අ) භාෂා නිපුණතාව

ආ) අභියෝග්‍යතා පරීක්ෂණය/ සාමාන්‍ය දැනුම

ඇ) පරිගණක පරීක්ෂණය

අ) භාෂා නිපුණතාව :

සරල ව්‍යාකරණ නීතිරීති යෙදවීමෙහිලා අයදුම්කරුගේ ප්‍රකාශනයේ, අවබෝධයේ, අක්ෂර විත්‍යාසයේ සහ දැනුමේ හැකියාව පිරික්සීමේ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

ආ) අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම.

මෙම ප්‍රශ්න පත්‍රය, අයදුම්කරුට ඔහුගේ/ ඇයගේ නීල රාජකාරී ඉටුකිරීමෙහි ලා අයදුම්කරුගේ අභියෝග්‍යතාව හා හැකියාව සහ වර්තමාන කටයුතු පිළිබඳව ඔහුගේ/ ඇයගේ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරනු පිණිස සැලසුම් කොට ඇත.

ඇ) පරිගණක පරීක්ෂණය :

මෙම පරීක්ෂණය අයදුම්කරුගේ පහත සඳහන් හැකියාවන් තක්සේරු කිරීම සඳහා වේ.

- තොරතුරු තාක්ෂණයේ මූලික සංකල්ප
- වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය සහ
- ගොනුගත කිරීම් කළමනාකරණය

පොදු කොන්දේසි

i) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ii) තනතුරෙහි රාජකාරී මැනැවින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

iii) විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

iv) තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, ස්ථිර කරන ලැබූ අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බැලීම් කාල සීමාවකට යටත්ව බඳවා ගනු ලැබේ.

v) තෝරාගනු ලැබූ සියලුම අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවනු ඇත.

අයදුම් කළයුතු ක්‍රමය

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානියාගේ තීර්දේශයන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් විසින්, එය අයදුම්පත්, තමන් විසින්ම පිළියෙල කර සම්පූර්ණ කළ යුතු වන අතර, (පහත දක්වා ඇති ආකෘතියට අනුකූලවන පරිදි පමණක් පුරවා සකස් කර) අයදුම්කරුවන්ගේ සියලු අධ්‍යාපනික සහ වෘත්තීයවේදී/ වෘත්තීයක සුදුසුකම් සහතික (සනාථ කිරීම සඳහා) ඒවායේ පිටපත්ද සමග 2020 දෙසැම්බර් මස 01 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවතේ අංක 385 හි "සුව සිරිපායේ" සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ලේකම් වෙත ලැබෙන සේ යොමුකර ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, **"අයදුම් කරනු ලබන තනතුර"** පැහැදිලිව සටහන් කළ යුතුය.

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

..... තනතුර සඳහා අයදුම්පත

01. සම්පූර්ණ නම : _____
02. මුලකුරු සමග නාමය : _____
03. ලිපිනය : _____
04. පදිංචි දිස්ත්‍රික්කය : _____
05. උපන් දිනය : _____
06. වයස : _____ අවුරුද්ද : _____ මාසය : _____ දින : _____
07. ස්ත්‍රී/ පුරුෂ භාවය : _____
08. ජාතික හැඳුනුම්පත් අංකය : (NIC) : _____
09. විභාගය සඳහා ඉදිරිපත් වන මාධ්‍ය : _____
10. දුරකථන අංකය : _____ ස්ථාවර : _____
ජංගම : _____ ඊමේල් ලිපිනය : _____
11. අධ්‍යාපනික සුදුසුකම් : _____
12. වෘත්තීයවේදී / වෘත්තීයික සුදුසුකම් : _____
13. පළපුරුද්ද : _____
14. ඥාතීන් නොවන තීර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම්, ලිපිත සහ දුරකථන අංක : _____

මා විසින් ඉහත ප්‍රකාශ කර දක්වන ලද සියලු විස්තර තොරතුරු සත්‍ය තීරවද සහ යථාතුරුප වන බැවින් ද මාගේ දැනීමට හා විශ්වාසයන්ට අනුකූලවන පරිදි වන බවද, මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය _____ _____

අයදුම්කරුගේ අත්සන